# සිඩ්නි නුවර මාලා අබේවික්‍රම නර්තායතනයේ කළ එළි මංගල්‍යය









සිඩ්නි නුවර මාලා අබේවික්‍රම නර්තායතනයේ කළ එළි මංගල්‍යය නර්තනය චරිත වර්ධනයට මහඟු මෙහෙවරක් ඉටු කරයි. උසස් හික්මීමක් ඇති මනුෂ්‍යත්වයෙන් යුත් සමාජයානු යෝගී සහයෝගීතාව, අනුන්ගේ අදහස්වලට ගරු කිරීම විචාර බුද්ධිය වැනි ගුණාංග රාශියක් මෙම විෂය හැදෑරීමෙන් ප්‍රගුණ කළ හැකිය. එමෙන්ම දේශිය සංස්කෘතිය වටහා ගැනීම සෞන්දර්‍යයාත්මක ආශ්වාදය, ශාරීරික නිරෝගිතාව, හිත හා මනස සමබරකර ගැනීම වැනි ගුණාංග රාශියක් මෙම විෂය තුළින් පුද්ගල මනසට ලබා දෙ.' නර්තනය පිළිබඳව මා එසේ සුළුවෙන් සඳහන් කළේ එම විෂයෙහි අගය පිළිබඳව අප මනසට කා වැදුණු හා නෙතට දකින්නට ලැබුණු පෞරාණික නර්තන සංස්කෘතික අංගයක් මෑතකදී දැකගන්නට ලැබූ නිසාය.




දේශීය නැටුම් කලාවේ පුනර්ජීවනය වෙනුවෙන් තම දැනුම කැප කරන, විප්‍රවාසී සිංහල තරුණ ප්‍රජාවට මහඟු සේවයක් ඉටු කරන මාලා අබේවික්‍රම මහත්මියගේ සිසුවියන් ඉදිරිපත් කළ, කළ එළි මංගල්‍යය උත්සවයක් සිඩ්නි නුවර ලංකාරාම විහාරස්ථ භූමියේදී ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවත්විණි.




පුරාණයේ සිටම උඩරට නැටුම් කලාව සමග අත්වැල් බැඳී එන, පා සරඹ, ගොඩ සරඹ, වන්නම්, කොහොඹ කංකාරිය වැනි නැටුම් අංග පිළිබඳව, අධ්‍යයනය කර මනා පුහුණුවක් ලැබූ සිසුවියන් වෙනුවෙන් මෙම උළෙල පැවැත්විණි. බුදුන් වැඳ පිරිත් සජ්ඣායනා ඇතුලු ආගමික වතාවත් මැදින්, මගුල් බෙර වයා චාරිත්‍රානුකූලව හිසට පායිම් පත පළන්දා සුදු පිරුවටින් ආවරණය වී පිරිසිදු ජලය ස්නානය කර දේව පූජාවන් පවත්වා දේවාර්ශිවාද ලැබ, මව්පිය දෙගුරුන් නමැද, තම මංගල නැටුම කළ එළියට පුජා කිරීමේ මංගල්‍යය කළ එළි මංගල්‍යය ලෙසින් හැඳින්වේ.

සිහින් වැහි බිඳු විසිරෙමින්, නිල්ල පිරි පූජනීය බිම් පෙත සිඹ ගත්, ලා හිරු කිරණ පිරි සොබාමත් සැඳෑවක අප දරු දැරියන් ඉදිරිපත් කළ මනස්කාන්ත කළ එළි නර්තනය පැමිණි සිටි සියලු නෑ හිත මිතුරන්ගේ සිත් අමන්දානන්දයට පත් කළහ.

## ලසන්ත වික්‍රමතුංග ඝාතනය කර සිව් වසරක් පිරෙයි



# ලසන්ත අමතක නොවන මතකය....

**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

එය බ්‍රහස්පතින්දාවකි. පසුදා නිකුත් කෙරෙන ''රාවය'' කලාපයේ අවසන් සංස්කරනයන් කරමින් කාර්යාලයේ රැඳී සිටියදී ඒ මුසල ආරංචිය අප කරා පැමිණියේය.

''ලසන්තට වෙඩි තියලා.''

එවක සෑම උදෑසනකම අප අවදිවූයේ කිසියම් අලුත් මූසල ආරංචියක් කණ වැකෙනු ඇතැයි යන ජුගුප්සාව සහ බියජනක සිතිවිල්ලක් සමගිනි. තත්ත්වය ඒ තරම්ම නරක අතට හැරී තිබිණ. සිව්වන ඊළාම් යුද්ධයේ උච්චතම අවධියක් වූ එවක ස්වාධීන ජනමාධ්‍යයට එරෙහිවද දිගින් දිගටම බිහිසුණු සහ මාරාන්තික ප්‍රහාර එල්ලවෙමින් තිබිණ. සිරස රූපවාහනී විකාශන මැදිරියට බෝම්බ ගසා විනාශ කර තිබිණ. ලංකා ඊ නිව්ස් කාර්යාලය ගිනි තබා විනාශ කර තිබිණ. ආණ්ඩුවේ උදහසට ලක්වූ ස්වාධීන මාධ්‍යවේදීන් ලුහුබැඳ නාදුනන තුවක්කුකරුවෝ සහ මාරාන්තික ප්‍රහාර හඹා එමින් තිබිණ.



ලසන්තට වෙඩි තබා ඇති බව දැනගත් වහාම අපි සිදුකරමින් සිටි සියළු කටයුතු නවතා ඒ පිළිබඳ සොයන්නට පටන් ගත්තෙමු. නිවෙසේ සිට සන්ඩේ ලීඩර් කාර්යාලයට පැමිනෙමින් සිටියදී අත්තිඩිය ප්‍රදේශයේදී ප්‍රහාරය එල්ල වී ඇති බවත්, ලසන්ත කළුබෝවිල රෝහල වෙත ගෙනයමින් සිටින බවත් දෙවනුව අපට දැනගන්නට ලැබිණ. අනතුරුව වික්ටර් අයිවන් මහතා කළුබෝවිල රෝහලත් මම වෙඩි තැබීම සිදුවූ ස්ථානයත් බලා පිටත්වුණෙමු.

ලසන්ත ප්‍රහාරයට ගොදුරු වී තිබුණේ අත්තිඩිය ආදර්ශ ප්‍රාථමික විද්‍යාලය ඉදිරිපිට මහා මාර්ගයේදීය. මම එම ස්ථානයට ළගාවන විට ගල්කිස්ස පොලිසියේ නිලධාරි කණ්ඩායමක් සිද්ධිය ඇසින් දුටුවන්ගේ ප්‍රකාශ ලබාගනිමින් සිටියහ. එහිදී අයෙකු කියා සිටියේ එම ස්ථානයේ ඇති පදික මාරුවේදී ලසන්තගේ මෝටර් රථයේ වේගය බාල වූ බවත්, ඒ සමඟම පසුපසින් පැමිණි යතුරුපැදි දෙකක් රථයේ ගමන්මග හරස් කර නතර කළ බවත්ය. ඒහාම තවත් යතුරු පැදි දෙකක් මෝටර් රථයේ ඉදිරි දොරවල් විවෘත කිරීමට නොහැකිවන සේ දෙපසින් නතර කළ බවත්, රියදුරු අසුන දෙසින් නතර කළ යතුරු පැදියෙන් බැසගත් පුද්ගලයකු කිසියම් ආයුධයකින් ගසා, රථයේ වීදුරුව කඩා, එම ආයුධයෙන්ම ලසන්තගේ හිසට අනිනු දුටු බවද ඔහු පැවසුවේය. ඝාතකයා ප්‍රහාරය එල්ල කළ ආකාරය සාක්ෂිකරු අභිනයෙන්ද පෙන්වීය. පත්තර කොළයකින් වැනි යමකින් ඔතන ලද අඩි දෙකක් පමණ දිග අවියක් ප්‍රහාරයට යොදාගත් බවද ඔහු කීවේය. එම අවස්ථාවේදී වෙඩි ශබ්දයක් ඇසුනේදැයි ගල්කිස්ස පොලිස් ස්ථානාධිපතිවරයා කීපවරක්ම විමසා සිටියද සාක්ෂිකරු දිගින් දිගටම කියා සිටියේ වෙඩි හඬක් නොඇසුන බවය. ඩොක් ඩොක් වැනි හඬක් පමණක් ඇසුණු බවය.



ප්‍රහාරකයන්ගේ පෙනුම සහ ඔවුහු පැමිණි යතුරු පැදි පිළිබඳ විස්තර කරමින් අයෙක් පවසා සිටියේ එම යතුරු පැදි කළු පැහැති විශාල ප්‍රමාණයේ ඒවා වූ බවය. හමුදාව පාවිච්චි කරන යතුරු පැදි හා සමාන බවය. ප්‍රහාරකයන් සියළු දෙනා අදුරු පැහැති ජැකට් හැඳ, මුහුණු ආවරණ සහිත හෙල්මට් පැළඳ සිටි බවද, ඉතා කෙටි වේලාවක් තුළ සිදුවූ මේ සිදුවීමෙන් පසු ප්‍රහාරයකයන් රත්මලාන ගුවන් හමුදා කඳවුර දෙසට පලා ගිය බවද ඔහු කීවේය. රත්මලාන ගුවන් හමුදා කඳවුර පිහිටා තිබුණේ ප්‍රහාරය එල්ල වූ ස්ථානයට මීටර් දෙතුන් සීයක් තරම් ආසන්නවය.

ලසන්තගේ තත්ත්වය සම්බන්ධයෙන් කිසිවක් අපරාධ ස්ථානයේ සිටි කිසිවෙකුත් දැන නොසිටියහ. එහි සිටි පොලිස් නිලධාරින්ද ලසන්තගේ තත්ත්වය පිළිබඳ විමසා සිටියේ සිදුවීම ආවරණය සඳහා පැමිණ සිටි මාධ්‍යවේදින්ගෙනි. ලසන්ත ශල්‍යාගාරයකට ගෙන ඇති බවට ලද තොරතුරක් හේතුවෙන් වික්ටර් අයිවන් මහතාද කළුබෝවිල රෝහලට යමින් සිටි ගමන නවතා, ආපසු හැරී කාර්යාලයට පැමිණ තිබිණ. වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමයේ සභාපති සනත් බාලසූරිය මගේ දුරකථනයට සම්බන්ධ වූයේ මේ අතරය. රෝහල්ගත කරන විට ලසන්ත ජීවතුන් අතර සිටියේද නැත්ද යන්න පිළිබඳ නිශ්චිත තොරතුරක් නැති බව පැවසූ සනත් වැඩිදුරටත් පැවසූයේ ශල්‍යාගාරයට ගැනීමට පෙර වෛද්‍යවරු දිගින් දිගටම ලසන්තගේ ලය තෙරපමින් හෘද ස්පන්ධනය පණ ගැන්වීමට උත්සාහ කරමින් සිටි බවට තොරතුරු ලැබුණු බවය.

ප්‍රහාරකයන් පලාගිය පසු අවට සිටි පුද්ගලයන් කිහිපදෙනෙක් එක්ව ලසන්ත මෝටර් රථයෙන් පිටතට ගෙන වෑන් රියකින් කළුබෝවිල රෝහල වෙත ගෙනගොස් තිබුණි. වෑන් රියට ගන්නා අවස්ථාව වන විට ලසන්ත අතේ ජංගම දුරකථනයක් තිබූ බවද රෝහලට ගෙන එන අතරේ, වෑන් රිය තුළදී ඔහු යමක් කියන්නට උත්සාහ ගත්තද මුවින් ශබ්ද පිටනොවූ බවද පසුව දැනගන්නට ලැබිණ.
සිද්ධිය ඇසින් දුටුවන්ගේ ප්‍රකාශවලට සවන් දීමෙන් පසු මම ලසන්තගේ මෝටර් රථය තිබෙන දෙසට ගමන් කළෙමි. ඒ වන විට පොලිසිය එය ප්‍රහාරය එල්ල වූ ස්ථානයෙන් ඉවත් කර, පාරේ අයිනක නතර කර තිබිණ. මෝටර් රථය ඉදිරියෙන් තිබූ යමක් දැක මම මොහොතකට වික්ෂිප්තව ගියෙමි. මෝටර් රථය ඉදිරිපසින් හරස් අතට නවතා තිබුණේ කළු පැහැති යතුරු පැදියකි. එය හරියටම ප්‍රහාරකයන් පැමිණි බවට සාක්ෂිකරුවෝ පැවසූ යතුරු පැදියක් හා සමාන විය. මදක් ඔබ්බෙන් පාර මැද තවත් එවැනිම යතුරු පැදියක් නතර කර තිබුණි. එම යතුරු පැදිවලින් පැමිණ තිබුණේ යද හමුදාවේ යතුරු පැදි ඒකකයක සාමාජිකයන්ය. අපරාධ ස්ථානයේ සිදුවෙමින් පවතින දේ නිරීක්ෂණය කරමින් සිටි මේ පිරිස සුළු වේලාවකට පසුව එම යතුරු පැදිවල නැගී ඉගිල ගියහ.

පැයකට වැඩි කාලයක් අපරාධ ස්ථානයේ තොරතුරු රැස්කරමින් එහි රැඳී සිටීමෙන් අනතුරුව මම නැවත රාවය කාර්යාලයට පැමිණියෙමි. ඒ වන විටත් ලසන්තගේ තත්ත්වය ගැන නිශ්චිත තොරතුරක් කාර්යාලයට පවා ලැබී නොතිබුණි. විද්‍යුත් මාධ්‍ය මගින් බ්‍රේකින් නිව්ස්වලට පවා ප්‍රකාශ කළේ සන්ඩේ ලීඩර් කර්තෘ ලසන්ත වික්‍රමතුංග ප්‍රහාරයකට ලක්ව ඇති බව පමණකි. ලසන්තගේ තත්ත්වය නිවැරදිව දැනගන්නා තෙක් පත්තරේ මුල් පිටුව සැළසුම් නොකරන්නට කර්තෘ මණ්ඩලය තීරණය කළහ.

පස්වරු දෙකට පමණ රූපවාහිනී නාලිකාවක් බ්‍රේකින් නිව්ස් ඉදිරිපත් කරමින් කියා සිටියේ ලසන්ත වික්‍රමතුංග ඊට සුළු වේලාවකට පෙර කළුබෝවිල රෝහලේදී ජීවිතක්ෂයට පත්වූ බවය. ලසන්ත වෙඩි ප්‍රහාරයකට ලක්ව ඇති බවට ප්‍රථම ආරංචිය ලද මොහොතේ සිටම අප අනුමාන කළේ ඔහු මිය යනු ඇති බවය. ඒ අන් කිසිවක් නිසා නොව ලසන්ත ඉලක්කකර පත්තුවෙන්නේ කවරෙකුගේ තුවක්කුවක්දැයි යන්න අපට අනුමාන කළ හැකිව තිබූ බැවිනි.

ලසන්තට අපගේ අවසන් ගෞරවයද, ජනමාධ්‍යය මර්ධනයට විරෝධයද පලකරමින් රාවය මුල් පිටුව කළු පසුබිමක සුදු අකුරින් මුද්‍රණය කරන්නට කර්තෘ මණ්ඩලය තීරණය කළහ.